සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**15 S I**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය ...................................  **ක්‍රිස්තියානි ධර්මය I**  කාලය පැය 01යි.

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ දේව පණිවිඩය ජනතාවට පිළිගැන් වූ තැනැත්තා,
   1. දිවැසිවරයා ය. 2. පූජකවරයා ය. 3. ආණ්ඩුකාරවරයා ය. 4. රජතුමා ය.

2. ආධ්‍යාත්මික හා සමාජමය වශයෙන් විවිධ කම්කටොලුවලට මුහුණ දෙමින් සිටි ජනතාවට මහත් අස්වැසිල්ලක් වූයේ ,
   1. මහා හෙරොද් රජුගේ රාජාභිෂේකය යි.
   2. පිලාත් ආණ්ඩුකාර ධූරයට පැමිණීම යි.
   3. කිතු උපත පිළිබඳව ප්‍රකාශකර තිබූ දිවැස්වැකි යි.
   4. රෝම පාලකයින්ගෙන් ජනතාවට ලැබුණු සහන යි.

3. කිතු උපත මුළු මහත් මානව වර්ගයාටම සුභාරංචියක් වූයේ
   1. නත්තල සැමරීමට අවස්ථාව උදාවීමයි.
   2. කිතුදහමේ ආරම්භය උදාවීමයි.
   3. රෝම පාලකයින්ගේ පීඩා අවසන් වීමයි.
   4. ගැළවීම අත්කර දුන් දිව්‍යමය ක්‍රියාවලිය සිදුවීමයි.

4. දාවිත්ගේ නුවර , දාවිත්ගේ පෙළපතින් කිතු උපත සිදුවන බවට අනාවැකි ප්‍රකාශ කළේ ,
   1. එසකියෙල් දිවැසිවරයා ය. 2. යෙසායා දිවැසිවරයා ය.
   3. ආමෝස් දිවැසිවරයා ය. 4. එළිෂා දිවැසිවරයා ය.

5. ජුදා සමාජය විසින් පව්කරුවන් ලෙස සැලකූ ජන කණ්ඩායම් අයත් පිළිතුර වන්නේ ,
   1. රෝගීන් , කාන්තාවන් , පරිසිවරුන් ය.
   2. වහලුන් , අන්‍යජාතීන් , දරුවන් ය.
   3. පූජකයින් , අන්‍යජාතීන් , වහලුන් ය.
   4. සද්දුසිවරුන් , දරුවන් , පූජකයින් ය.

6. දෙවියන්වහන්සේ තෝරාගත් ජනතාව අතරින් අධිපතියෙක් පහළවන බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ ,
   1. යෙසායා ය. 2. ආමෝස් ය. 3. මීකා ය. 4. එසකියෙල් ය.

7. රෝම පාලනයෙන් දැඩි පීඩාවට පත්ව සිටි ජුදා ජනතාව තමන් ගළවා ගැනීමට පැමිණෙන්නේ යයි අපේක්ෂාවෙන් සිටියේ ,
   1. දිවැසිවරයෙ කි. 2. රජ කෙනෙකි.
   3. නායකයෙකි. 4. මෙසියස්වරයෙකි.

8. යෙසායා දිවැසිවරයාට අනුව ජේසුස් වහන්සේගේ මෙහෙවරට අවශ්‍ය පසුබිම සකස් කිරීමේ වගකීම පැවරෙන්නේ ,
   1. ස්නාවක ජොහාන්තුමාට ය. 2. සෙකරියස් පූජකතුමාට ය.
   3. සිමියොන් දිවැසිවරයාට ය. 4. සාමුවෙල් පූජකවරයාට ය.

9. ලෝකයේ පව් දුරුකරන දෙවියන්ගේ බැටළු පෝතකයාණන් ලෙස ජේසුස් වහන්සේව හැඳින්වූයේ කවුරුන් ද ?
   1. සිමියොන් දිවැසිවරයා ය. 2. අන්නා දිවැසිවරිය ය.
   3. ස්නාවක ජොහාන් ය. 4. සිමොන් පේදුරු ය.

10. ජේසුස් වහන්සේගේ සේවකත්වය පිළිබඳව පිලිප් විසින් පහදා දෙනු ලැබුවේ,
   1. රෝම ශාතාධිපතියාට ය. 2. එතියෝපීය නපුංසකයාට ය.
   3. පිලාත් ආණ්ඩුකාරවරයාට ය. 4. සිරියාවේ නාමන්ට ය.

11. ජේසුස් වහන්සේ තම මාංශවත්වීමේ අරමුණ මුලින්ම හෙළිකරනු ලැබුවේ ,
   1. නාසරෙත් ධර්මශාලාවේදී ය.   2. ජෙරුසලම් දේවමාලිගාවේදී ය.
   3. ගලීල මුහුදු වෙරළේදී ය.   4. අවසන් පාස්කු භෝජන අවස්ථාවේදී ය.

12. විශේෂ දරු උපත් පිළිබඳ දේව පණිවිඩය රැගෙන එනු ලැබුවේ,
   1. මිකායෙල් දේව දූතයා ය.   2. එළියස් දේව දූතයා ය.
   3. සලමොන් දේව දූතයා ය.   4. ගාබ්‍රියෙල් දේවදූතයා ය.

13. ස්නාවක ජොහාන්තුමා ජනතාව ස්වාමීන් වහන්සේ වෙත හරවමින් ඔවුන්ට දෙනු ලැබුවේ,
   1. ශුද්ධාත්ම දානය යි.   2. ගැළවීමේ වරම යි.
   3. දේවරාජ්‍යයේ වරම යි.   4. මනස්ථාපනයේ බව්තීස්මය යි.

14. මහලු සෙකරියස් පූජකතුමා සහ එළිසබෙත්තුමිය දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ කුමක් ද?
   1. දේවමාළිගාවේ සුවඳදුම් ඔප්පු කිරීමේ වරය ලබාදෙන ලෙස ය.
   2. දේවමාළිගාවේ නායක පූජක තනතුර ලබාදෙන ලෙසය .
   3. තමන්ට දරුවකු ලබාදෙන ලෙස ය.
   4. රෝම පාලනයෙන් රට නිදහස් කරදෙන ලෙස ය.

15. දේවදූත පණිවිඩයට අනුමානයෙන් ප්‍රතිචාර දක්වූයේ ,
   1. එළිසබෙත් තුමියයි.   2. සෙකරියස් පුජකතුමයි.
   3. මරියතුමියයි.   3. ජෝසෙප්තුමයි.

16. දේවපුත්‍රයාණන් මෙලොවට බිහිකිරීම සඳහා තමාව තෝරාගැනීම ගැන මරියතුමී,
   1. නිහතමානීව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා ය.
   2. මහත් ආඩම්බරයෙන් අන් අයට ප්‍රකාශ තළා ය.
   3. තමාට ලැබෙන තත්වය ගැන වර්ණනා කළා ය.
   4. තමා දේව මාතාව ලෙස අගය කලා ය.

17. ස්නාවක ජොහාන්තුමා ඊශ්‍රායලයට ප්‍රකාශවන දිනය තෙක් වාසය කළේ ,
   1. පාළුකරයේ ය.   2 .හෙරොද්රජ් මාළිගයේ ය.
   3. ජෙරුසෙලම් දේව මාළිගයේ ය.   4. පියාගේ නිවසේ ය.

18. සෙකරියස්ගේ හා එළිසබෙත්ගේ ජීවිත තුලින් කිතුනු අපට දෙන පණිවිඩය වන්නේ ,
   1. දෙවියන් අපේ හඬට පිළිතුරු දෙන බවයි.
   2. අපි දෙවිඳුන්ට කණ්නලව් කළ යුතු බවයි.
   3. දෙවිඳුන් පිළිතුරු දෙනවිට ඇදහිල්ලෙන් විශ්වාසයෙන් පිළිගත යුතු බවයි.
   4. දෙවිඳුන්ගේ හඬට ඇහුන්කන් දීගෙන සිටිය යුතු බවයි.

19. ජේසු උපත එඬේරුන් වෙත දැන්වීමට ගිය දේව දූතයින් ප්‍රකාශ කළේ,
   1. ජුදා ජාතිය පාලනය කරන රජෙකු ඉපිද සිටින බව ය.
   2. ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බවන්නේය යන්න ය.
   3. දේව පුත්‍රයා මේ ලෝකයට පැමිණ සිටිනවා ඔබට සම්බවන්නේය යන්න ය.
   4. ඔබ උදෙසා මාංශවත් වූ දේව පුත්‍රයා ඔබට සම්බවන්නේය යන්න ය.

20. නාසරෙත් නුවර විසූ ජෝසෙප් තුමාට හා මරියතුමියට සංගණනය සඳහා ජෙරුසෙලමටය යාමට සිදුවූයේ ,
   1. නාසරෙත්වල ඉඩ නොතිබුන නිසා ය.
   2. සියලු දෙනා බෙත්ලෙහෙමට යා යුතු වු නිසා ය.
   3. ජුදා ජාතීන් බෙත්ලෙහෙමේ ජීවත් වු නිසා ය.
   4. දාවිත්ගේ වංශයට හා පෙළපතට අයිති නිසා ය.

21. ජුදා ජනතාව ආගමික වශයෙන් දැඩි පිඩාවට ලක් කරමින් සිටි ජන කණ්ඩායම් දෙක වන්නේ ,
   1. පරිසිවරු හා අයකැමියන්ය.   2. සද්දූසිවරු හා පරිසිවරුය.
   3. අයකැමියන් හා පරිසිවරුය.   4. සද්දූසිවරු හා අයකැමියන්ය.

22. ජේසුස් වහන්සේගේ ක්‍රියා පිළිවෙතක් නොවූයේ ,
1. පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප කිරීමයි.
2. පව්කරුවන් ඇසුරු කිරීමයි.
3. පව්කරුවන්ගේ නිවෙස්වලට යාමයි.
4. පව්කරුවන් සමඟ ආහාර ගැනීමයි.

23. ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට සන්තක වීමේ තත්වයට ඇතුළු වීමට ඉටුකළ චාරිත්‍රය වූයේ ,
1. කැපකිරීම යි . 2. බෞතීස්මය යි. 3. චර්මඡේදනය යි. 4. අභිවෘද්ධියාලේපය යි.

24. ජුදෙව් සමාජයේ පිරිමි දරුවන්ට වයස අවුරුදු 12 වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ඔවුන් ,
1. දේව මාලිගයට භාර කිරීමයි. 2. බෞතීස්ම ස්නාපනය ලැබීමයි.
3. අභිවෘද්ධිආලේපය ලැබීමයි. 4. වැඩිහිටියන් සේ පිළිගැනීමයි.

25. ස්නාවක ජොහාන් තුමාගේ පණිවිඩය මූලික වශයෙන් යොමු වූ ප්‍රදේශ වන්නේ ,
1. ජුදය , ගලීලය , ලුස්ත්‍රාව 2. ගලීලය , ත්‍රිකෝණිය , අබිලේනය
3. ගලීලය , ඉතුරය , සමාරියාව 4. ජුදය , අබිලේනය , දර්බය

26. ස්නාවක ජොහාන්තුමාගේ කාලයේ රෝම පාලනයට විරුද්ධව රටතුළ ජනතාව අතර නොසන්සුන් තාවයක් ඇතිවූයේ ,
1. රෝම පාලකයාගේ දරුණුකම නිසා ය.
2. පලස්තීනයේ රජකෙනෙකු පත්වූ නිසා ය.
3. විවිධ බදු මඟින් ජනතාව පීඩාවට පත්ව සිටි නිසා ය.
4. පාලකයින් එල්ල කල විවිධ වධ හිංසා නිසා ය.

27. ජුදා ජනතාව අයකැමියන් පව්කරුවන් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ඔවුන් ,
1. රෝම ජාතිකයන් වූ නිසා ය. 2. සමාරිය ජාතිකයන් වූ නිසා ය.
3. දේව මාළිගාවට විරුද්ධව සිටි නිසා ය. 4. රෝම අධිරාජ්‍ය වෙනුවෙන් බදු අයකල නිසා ය.

28. ස්නාවක ජොහාන්තුමාගේ කාලයේ උත්තමපූජක තනතුර දරනු ලැබුවේ ,
1. කායපස් ය 2. නාමන් ය 3. ලාහෝර් ය 4. ජොනතන් ය

29. ස්නාවක ජොහාන්තුමා ජේසුස් වහන්සේගේ පෙරමඟ දූත කාර්යය සිදු කළේ ,
1. මනස්ථාපනයේ බෞතීස්මය තුළිනි.
2. ශුද්ධාත්මදානය ලබාදීමෙනි.
3. ජනතාවට චෝදනා කිරීමෙනි.
4. ජනතාවට අනුකම්පාව දක්වීමෙනි.

30. සිය වරද පෙන්වා දීම නිසා හෙරොද් රජු ස්නාවක ජොහාන්තුමාට ,
1. ස්තුතිය පුද කළේ ය. 2. රාජ මාළිගයේ තනතුරක් ලබාදුන්නේ ය.
3. සිරකර මරා දැමුවේ ය. 4. රටින් පිටුවහල් කළේ ය.

31. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය ලෙස සලකනු ලැබුවේ,
1. නාසරෙත් සිනගෝගය යි. 2. ජෙරුසලම් දේව මාළිගය යි.
3. උත්තම පූජකයාගේ නිවස යි. 4. හෙරොද් රජ මාළිගය යි.

32. තම සේවය පිලිබඳව දිව්‍යස්වැකිය සම්පූර්ණ වූ බවට ජේසුස් වහන්සේ කළ ප්‍රකාශය හඳුන්වන්නේ ,
1. උත්තම පූජක යැදුම ලෙසය. 2. නයිසීන ප්‍රකාශය ලෙසය.
3. රන් අණ ලෙසය. 4. නාසරෙත්හි ප්‍රකාශය ලෙසය.

33. ජුදෙව් ව්‍යවස්ථාව අනුව ' ජුබිලි වසරේ ' කල යුතු අනිවාර්ය කරුණක් වන්නේ ,
1. දශයෙන් කොටස පිදීම යි. 2. කුලුඳුලන් කැපකිරීමයි.
3. වහලුන්ට නිදහස දීමයි. 4. දේව මාළිගාව පවිත්‍ර කිරීමයි.

34. දේව රාජ්‍යය සියලු දෙනාටම විවෘත බව පෙන්වීමට ජේසුස් වහන්සේ මුලින්ම ප්‍රකාශ කළේ,
1. යහපත් සමාරිතයාගේ උපමා කතාව ය.
2. ශාරපෙත් වැන්දඹුව හා සිරියාවේ නාමන් පිළිබඳ සිද්ධිය ය.
3. අබ ඇටයේ උපමාව ය.
4. සමාරිය ස්ත්‍රියගෙන් ජලය ඉල්ලීමේ සිද්ධිය ය.

35. යුදෙව් ජන සමාජය තුළ පූජක , රජ , දිවැසිවරුන් එම කාර්යය සඳහා කැපකරනු ලබන්නේ ,
   1. තෙලින් ආලේප කිරීමෙනි.
   2. හිසමත අත තබා යාච්ඤා කිරීමෙනි.
   3. දේව මාලිගාවේ කැපකිරීමෙනි.
   4. ජනතාවගේ වැඩි කැමැත්තෙනි.

36. ජේසුස් වහන්සේගේ ජීවිතය හා සේවය සමග බොහෝ සම්බන්ධතා ඇති ස්ථානය සඳහා භාවිතා වූ නමක් නොවන්නේ ,

   1. ගෙනසෙරෙත් විල   2. ගලීල මුහුද   3. තිබේරියස් මුහුද   4. මධ්‍යධරණී මුහුද

37. මුහුදු වෙරළේ දැල් සෝදමින් සිටිය දී ජේසුස් වහන්සේට මුණ ගැසුනු ධීවරයින් සිව්දෙනා වන්නේ ,
   1. පේදුරු , මතෙව් , ජාකොබ් , ජොහාන් ය.
   2. පේදුරු ,ඇන්ඩෘ , මතෙව් , ජොහාන් ය.
   3. ජාකොබ් , ජොහාන් ,ඇන්ඩෘ , මතෙව් ය.
   4. ජොහාන් , ඇන්ඩෘ , පේදුරු , ජාකොබ් ය.

38. ' මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත ' යනුවෙන් ජේසුස් වහන්සේ වදාලේ ,
   1. තම පාමුල වැඳ වැටුණු ධීවරයාට ය.
   2. සමාරිය ලිඳ ලඟ හමුවූ ස්ත්‍රීයට ය.
   3. දමස්කයට යන මඟ දී හමු වූ මිනිසාට ය.
   4. බෙනාතියේ දී සුවය ලැබූ කොරාටය.

39. ධර්මදූත සේවයේ දී මුහුණ දීමට සිදුවන පීඩා හා අභියෝග පිලිබඳව ප්‍රකාශ කළේ ,
   1. 'විසකුරු සර්පයින් මැදට යවමි' යනුවෙනි.
   2. 'කුරිරු මිනිසුන් මැදට යවමි' යනුවෙනි.
   3. 'වග වලසුන් මැදට යවමි' යනුවෙනි.
   4. 'අන්ධකාරයේ අභියෝග මැදට යවමි' යනුවෙනි.

40. ' නපුරේ බලය තමන්ට අවනත වීම නිසා නොව ස්වර්ගයේ නම ලියවී ඇති නිසා ප්‍රීතිවන්න' ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,
   1. තම සේවය ගැන ශ්‍රාවකයින් ප්‍රීතිවීම ගැන උරණවීමෙනි.
   2. සේවයට කැඳවීමේ උතුම්කම පෙන්වා දිමේ අදහසිනි.
   3. කිතුනුවන් සේවය කළ යුතු බව පෙන්වා දීමේ අදහසිනි.
   4. කිතුනුවන් සේවයේ යෙදිය යුතු බව පෙන්වා දීමේ අදහසිනි.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**62 | S | II**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **ක්‍රිස්තියානි ධර්මය II** කාලය පැය දෙකයි

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්ණ පහකට පිළිතුරු සපයන්න.**

1) පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න

1. පහත වාක්‍යය සම්පූර්ණ කරන්න.
   අ) දාවිත්ගේ රජ පෙළපත නැමති ...........................................................................................
   ආ) එහි මුල්වලින් .............................................................................................................
2. 'අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය. ගණදුරු දේශයේ විසූ අය කෙරෙහි එළියක් බැබළෙන්නේය.' මෙම ප්‍රකාශය පැවසුවේ කවුරුන් ද ? එයින් කියවෙන්නේ කවුරුන් ගැන ද?
3. යෙසායා දිවැසිවරයාට අනුව ජේසුතුමන් තුළ ප්‍රකාශවන ප්‍රධාන ගුණාංග දෙක ලියන්න.
4. ' මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි ' මෙම ප්‍රකාශය කළ දිවැසිවරයා කවුරුන් ද'? කීවේ කවුරුන් ගැනද?
5. ජේසුස් වහන්සේගේ මාංශ ගතවීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න.
6. 'මාගේ ස්වාමීන් වහන්සේ ගේ මෑණියන් ' මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේ කවුද ? කාටද?
7. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයෙන් අවධාරණය කෙරෙන සත්‍යතාවයන් දෙකක් ලියන්න.
8. ජේසු උපත බෙත්ලෙහෙමේ දී සිදුවීමෙන් සනාථ වූ වැදගත් කරුණු දෙකක් ලියන්න.
9. ජේසුස් වහන්සේ කැපකිරීමට දේව මාළිගයට පැමිණි දෙමාපියනට මුණගැසුනේ කවුරුන් ද?
10. ජේසුස් වහන්සේ ශ්‍රාවකයින් හැත්තෑදෙනා පිටත්කර යැවීමේ දී ඔවුන්ට පැවරූ කාර්යයන් දෙකක් ලියන්න.

(ලකුණු 2x10=20)

2) සැබවින්ම යුක්තිය ඉටු කරන්නේය. එතුමා කලකිරෙන්නේවත් අධෛර්‍ය වන්නේවත් නැත. මිහිපිට යුක්තිය ඉටුවනතුරු එතුමාගේ දහම් මග උදාවනතුරු දිවසින් බලාසිටිනු ඇත'

1. ඉහත දිවැස්වැකියෙන් කියවෙන්නේ කුමක් ගැනද? (ල - 2)
2. ජනතාවට පීඩා කිරීම නිසා ජේසුස් වහන්සේගේ විවේචනයට ලක් වූ ජන කණ්ඩායම් තුනක් නම් කරන්න. (ල - 3)
3. වත්මන් සමාජය තුළ ජනතාවට පීඩා කරන්නන් උදෙසා කිතුනුවකු ලෙස ඔබ ක්‍රියාකරන ආකාරය කරුණු පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල - 5)

3)
1. ජේසුස් වහන්සේගේ කාලයේ පව්කරුවන් ලෙස සලකා සමාජයෙන් ප්‍රතික්ෂේප කරන ලද ජන කණ්ඩායම් හතරක් නම් කරන්න. (ල - 2)
2. එවැනි අය වෙනුවෙන් ජේසුස් වහන්සේ පෙනී සිටි එක් අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල - 3)
3. වත්මන් සමාජය තුළ ප්‍රතික්ෂේප වූවන් වෙනුවෙන් කිතුණු දරුවකු ලෙස ඔබ ක්‍රියා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න . (ල - 5)

4)
1. ජුදෙව් කුළුඳුල් පිරිමි දරුවන් කැපකිරීමේ චාරිත්‍රය ආරම්භ වීමට මූලික වූ හේතුව ලියන්න. (ල - 2)
2. ජේසුස් වහන්සේ වෙනුවෙන් එම චාරිත්‍රය ඉටුකළ අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල - 3)
3. වත්මන් සමාජය තුළ පවතින චාරිත්‍ර පහක් නම් කර ඒවා කිතුණු විශ්වාසයට පටහැනි නොවන ලෙස ඉටුකරන ආකාරය ලියන්න. (ල - 5)

5)

1. ස්නාවක ජොහාන්තුමා වෙත පැමිණි පොදු ජනතාවට එතුමා දුන් අවවාදය කුමක් ද? (ල - 2)
2. එම අවවාදය මගින් එතුමා ඉගැන්වූයේ කෙබඳු ක්‍රියාවන් ගැනද? (ල - 3)
3. වත්මන් කිතුනු සමාජයේ සමාජිකයකු ලෙස ඔබ එම උපදෙස ක්‍රියාවට නංවන්නේ කෙසේදැයි විස්තර කරන්න (ල - 5)

6)

1. ස්නාවක ජොහාන්තුමා තම අනුශාසනාවෙන් පෙන්වා දෙන රෝම හේවායන් තුළ පැවති අයහපත් කටයුතු දෙක ලියා දක්වන්න. (ල - 2)
2. ජොහාන්තුමා ඔවුන්ට ලබාදුන් අනුශාසනාව කෙටියෙන් ලියන්න. (ල - 2)
3. ජොහාන්තුමාගේ මෙම අනුශාසනාව වත්මන් රාජ්‍ය ආරක්ෂක අංශයට කෙසේ බලපාන්නේ දැයි පැහැදිලි කරන්න. (ල - 5)

7) පහත මාතෘකා අතුරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

1. කුළුඳුලන් කැපකිරීම (ල - 5)
2. පෙරමඟ දූත කාර්යය (ල - 5)
3. නාසරෙත් ධර්ම දේශනය (ල - 5)
4. ශ්‍රාවකයින් කැඳවීම (ල - 5)

**පළමු වාර පරීක්ෂණය - 2018**
**ක්‍රිස්තියානි ධර්මය - 10 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 1-1 | 11-1 | 21-2 | 31-2 |
| 2-3 | 12-4 | 22-1 | 32-4 |
| 3-4 | 13-4 | 23-3 | 33-3 |
| 4-2 | 14-3 | 24-4 | 34-2 |
| 5-2 | 15-2 | 25-2 | 35-1 |
| 6-3 | 16-1 | 26-3 | 36-4 |
| 7-4 | 17-1 | 27-4 | 37-4 |
| 8-1 | 18-3 | 28-1 | 38-1 |
| 9-3 | 19-2 | 29-1 | 39-3 |
| 10-2 | 20-4 | 30-3 | 40-2 |

ශ ĈŔÇĆĚÇĆÅ

II - **කොටස**

1)

1. අ) වෘක්ෂයෙන් රාජාංකුරයක් හටගන්නේය.
   ආ) අලුත් පැළයක් නැගී එන්නේය
2. යෙසායා දිවැසිවරයා
   ජේසුස් වහන්සේ
3. යුක්තිය හා ධර්මිෂ්ඨකම
4. මලාකි දිවැසිවරයා , ස්නාවක ජොහාන් ගැන
5. දිළිඳුන්ට සුභ අස්න ප්‍රකාශ කිරීම , පීඩිතයන් මුදවා ගැනීම , වහළුන්ට මිදීම , සිරකරුවන්ට නිදහස දීමටය
6. එළිසබෙත්තුමිය විසින් මරියතුමියට
7. මෙම උපත මගින් දෙවි සමිඳාණෝ ජනතාවගේ විමුක්තිය සලසන බව , ජේසුස් වහන්සේගේ මෙහෙවරට පෙරමඟ සැකසීම තම පුත්‍රයා මගින් කරන බව , තම පුත්‍රයා ජනතාව මනස්ථාපනයට කැඳවන බව , ජේසුස් වහන්සේගේ අදහාගත් අයට පව් කමාව ලැබෙන බව
8. අ) දේව සැලැස්ම සම්පූර්ණ වීම
   ආ) ජනතාවගේ බලාපොරොත්තු ඉටුවීම
9. සිමියොන් දිවැසිවරයා සහ අන්නා දිවැසිවරිය
10. සේවකයින් ඉල්ලා යාච්ඤා කිරීම , නිවෙස් වලට සාමය පැතීම , රෝගීන් සුව කිරීම , දෙවියන් වහන්සේගේ රාජ්‍යය පැමිණ ඇති බව දැන්වීම

(ලකුණු 1x10=20

2)

1. ජේසුස් වහන්සේට තම මෙහෙවරේදී මුහුණ දීමට සිදුවන අභියෝග හා ඒවාට උන්වහන්සේ මුහුණදෙන ආකාරය (ල - 2)
2. රෝම අධිරාජ්‍ය නිළධාරීන් , පරිසිවරුන් , ලියන්නන් , සද්දුසිවරුන් , අයකැමියන් ( ල - 2)
3. සමාජය තුළ සිදුවන විවිධ අසාධාරණකම් , ඒවාට මුල්වන්නන් හා ඒවා නැවැත්වීමට ක්‍රියා කරන අයුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න (ල - 5)

3)

1. රෝගීන් , වැන්දඹුවන් , අන්‍ය ජාතීන් , දරුවන් , අයකැමියන් වැනි අය (ල-2)
2. ලාදුරු රෝගියා ස්පර්ශ කිරීම , සාමාජිකයින් අගය කිරීම , දරුවන් පිළිගැනීම , මාර්තා හා මරියාගේ නිවසට යාම වැනි අවස්ථා (ල - 3)
3. වත්මන් සමාජය තුළ කිතුනු දරුවන් ලෙස ක්‍රියාකරන ආකාරය ලියා ඇති කරුණු අනුව ලකුනු ලබා දෙන්න (ල - 5)

4)

1. ඊශ්‍රායෙල් ජනතාව වහල්කමින් මිදී මිසර දේශයෙන් පිටවූ රාත්‍රියේ ඔවුන්ගේ කුළුඳුල් පිරිමි දරුවන් විනාශ නොවුනි. එම රැකවරණය සිහි කරනු සඳහා ඉපදී දින 40 දී කැපකළ යුතුය. (ල-2)
2. කොබෙයියන් දෙදෙනෙකු පූජා කිරීමෙන් ජේසුස් වහන්සේ වෙනුවෙන් එම චාරිත්‍රය ඉටුකරන ලදී (ල-3)
3. කිතුනු ඇදහිල්ලට හා බයිබලීය පදනමට පටහැනි නොවන ලෙසට එම චාරිත්‍ර ඉටු කිරීම පිළිබඳව ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. චාරිත්‍ර - සිංහල අලුත් අවුරුද්ද , මුල් ගල තැබීම , ගෙට ගෙවදීම , ඉඳුල් කට ගෑම , අකුරු කියවීම වැනි චාරිත්‍ර (ල - 5)

5)

1. ' අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න , කෑම ඇති අයද එසේම කරන්න. ' (ල-2)
2. තමන්ට තිබෙන දේ අන් අය සමග බෙදා ගනිමින් අන් අය රැකබලා ගැනීම, පෝෂණය කිරීමවැනි දේ ක්‍රියාවට නැංවීම ල-3)
3. තමන් සතු දේ අන් අය සමග බෙදා ගැනීම පිළිබඳව විස්තර කර ලියා ඇත්නම් ලකුනු ලබා දෙන්න. (ල-5)

6)

1. තම නිළ බලය යොදා ගනිමින් බලහත්කාරයෙන් ජනතාවගේ දේවල් ලබා ගැනීම , තම වැටුපෙන් සෑහීමකට පත්නොවී තම නිල බලය යොදා ගනිමින් ජනතාවගේ මූල්‍යමය වාසි ලබා ගැනීම. (ල-2)
2. බලය පවතින විටදී එය නිසි ලෙස හා සාදාරණ ලෙසට භාවිතා කිරීම අවශ්‍යය. එවිට සමාජයේ සෑම අයෙකුටම බියෙන් තොරව ආරක්ෂිතව ජීවත් විය හැකිය. එවැනි සමාජයක් ගොඩ නැගීමට මනස්ථාපනයෙන් යුතුව නවතාවයකින් තම රැකියාවේ යෙදීමට අභියෝග කරයි
3. වත්මන් සමාජයේ රාජ්‍ය නිළධාරින් තම බලය අයුතු ලෙස යොදා ගන්නා අයුරු හා ජොහාන්තුමාගේ ඉගැන්වීම් අනුව ක්‍රියා කල යුතු ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල- 5)

7)

1. කුළුඳුලක් කැප කිරීම
   ඊශ්‍රායෙල් ජනතාව මිසරයෙන් නිදහස් වීමේ දී ඊශ්‍රායල් කුළුඳුලන් ආරක්ෂා වීම සිහිපත් කිරීමට සිදුකරනු ලබයි. දින 40 දී මෙම චාරිත්‍රය ඉටු කරයි. මෙය ඉටු කිරීමේ දී කොබෙයියන් හො පරෙවියන් දෙදෙනෙකු පූජා කරයි. ජේසුස් වහන්සේ වෙනුවෙන් මෙම චාරිත්‍රය දෙමාපියන් ඉටු කරන ලදී. (ල-5)

2. පෙරමඟ දූත සේවය
   ස්නාවක ජොහාන් තුමාගේ උපත දේව සැලැස්මට අනුව සිදුවූ බවද දේව කැමැත්ත අනුව ජීවත් වීම සඳහා මනස්ථාපනයේ බෞතීස්මය ලබා දීම සිදු කරන ලදී. එතුමන් වෙත පැමිණි විවිධ ජන කණ්ඩායම් වෙත අවවාද දී ඔවුන් මනස්ථානයේ බෞතීස්මය වෙත කැඳවන ලදී. ජේසුස් වහන්සේගේ පෙරමග දූත කාර්යය ඉටුකරන ලදී. (ල-5)

3. නාසරෙත් ධර්ම දේශනය
   ජේසුස් වහන්සේ රෙබ්බී කෙනෙකු මෙන් පිළිගන්නා ලදී. දේවස්ථාන සේවකයා යෙහාසා දිවැසිවරයාගේ පොත එතුමන්ට දෙන ලදී. ජේසුස් වහන්සේ එහි (61 1-2) තම සේවය පිළිබඳව සඳහන් වී ඇති තැන පෙරළා නැගිට එය කියවා එම පාඨය ඉටු වී ඇති බව ප්‍රකාශ කිරීම. රැස්ව සිටි පිරිසක් එය පිළිගැනීම පිරිසක් ප්‍රතික්ෂේප කිරීම, ඔවුන් උන්වහන්සේට තර්ජනය කිරීම (ල-5)

4. ශ්‍රාවකයින් කැඳවීම
   තිබේරියස් විල අසලින් මුල්ම ශ්‍රාවකයින් කැඳවීම සිදුකිරීම ධීවරයින් සතර දෙනෙකු එක්වීම, සුංගම්පොළ වෙත ගොස් ලෙවී නම් අයකැමියෙකු කැදවීම, මෙලෙස විවිධ ප්‍රදේශ වලින් විවිධ වෘත්තීන්ගෙන් විවිධ මත දරූ අයගෙන්කැදවා ගැනීම, විවිධත්වය තුළ එකමුතුබව පෙන්වා දේ. උන්වහන්සේගේ ශ්‍රාවකත්වය තුළ ජාතිභේද, කුළභේද ,වර්ණභේද, උස්මිටි ,කළු සුදු, උගත් නූගත්, භේද නොමැති බව (ල-5)